# භූගෝල විද්‍යාව

11 ශ්‍රේණිය

# ලෝක ජන සංඛ්‍යාව



- පෘථිවිය මත වෙසෙන මුළු මිනිස් ගහනයයි.
- ලෝක ජන සංඛ්‍යාව පිළිබඳ සැලකීමේ දී වැදගත් වන ක්ෂේත්‍ර දෙකකි.
  - මිනිසාට උපතින් ම හිමිවන පුමිතිරි බව, මානව වර්ගය, වයස ආදී ලක්ෂණ
  - පසුව උරුම කරගනු ලබන ජාතිය, ආගම, භාෂාව, සාක්ෂරතාව වැනි ලක්ෂණ

# ලෝක ජන සංඛ්‍යාවේ විශාලත්වය

- ලෝක ජන සංඛ්‍යාව වැඩිම මහාද්වීපය ආසියා මහාද්වීපය (60%) වන අතර අඩුම මහාද්වීපය  ඇන්ටාක්ටික් මහාද්වීපයයි .
- මුළු ජන සංඛ්‍යාවෙන් 76%ක්ම ජීවත් වන්නේ ආසියා හා අප්‍රිකා මහාද්වීපවල ය.
- ලෝකයේ ජනසංඛ්‍යාව වැඩිම රට චීනය වන අතර දෙවන ස්ථානය ඉන්දියාවට හිමිවේ. මෙම රටවල් දෙකම ආසියා මහාද්වීපයේ පිහිටා ඇත.
- ලෝක ජන සංඛ්‍යාව මිලියන 100ට වැඩි රටවල් 23ක් පමණ ඇත.
- ජන සංඛ්‍යාව අධිකම රටවල් 10 අතරින් 7ක්ම පිහිටා ඇත්තේ ආසියා මහාද්වීපය තුළයි.
  - ඒවා නම්,
    - චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, පකිස්ථානය, බංග්ලාදේශය, රුසියාව, ජපානය

# ලෝක ජන සංඛ්‍යා වර්ධනය

- වර්ෂයක් තුළ ජන සංඛ්‍යාවේ සිදුවන වර්ධනය වාර්ෂික ජන සංඛ්‍යා වර්ධනය නම් වේ.

කැපී පෙනෙන අවධි දෙකකි.

- දීර්ඝ කාලයක් තිස්සේ මන්දගාමී වර්ධනයක් සිදු වූ අවධිය (මානව සංහතිය ආරම්භ වූ දා සිට 1750 දක්වා)
    - උපත් අනුපාතිකය මෙන්ම මරණ අනුපාතිකය ද ඉහළ මට්ටමක පැවති නිසා ස්වාභාවික වර්ධන වේගය පහළ මට්ටමක පැවතීම
- කෙටි කාලයක් තුළ සීඝ්‍ර වර්ධනයක් සිදු වූ අවධිය (ක්‍රි.ව.1750 සිට මේ දක්වා)
    - උපත් අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීමත් මරණ අනුපාතිකය අඩු වීමත් නිසා ජන සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනයක් සිදු වීම (ජන සංඛ්‍යා ස්ඵෝටනය)

# ජන සංඛ්‍යා වර්ධනයේ විශේෂ ලක්ෂණ

- ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගතවී ඇති කාලය ක්‍රමයෙන් කෙටි වීම. එනම් ක්‍රි.ව.1800 දී බිලියන 1ක් වූ ජන සංඛ්‍යාව ක්‍රි.ව.2011 වන විට බිලියන 7ක් දක්වා සීඝ්‍රයෙන් වර්ධනය වී ඇත.
- ලෝක ජන සංඛ්‍යාව 2014 මාර්තු වන විට බිලියන 7.225ක් වී තිබේ.
- වර්තමානය වන විට ජන සංඛ්‍යාව දෙගුණ වීම සඳහා ගත වී ඇත්තේ අවුරුදු 12ක් වැනි කෙටි කාලයකි.
- ක්‍රි.ව.1950න් පසු කාලයේ දී සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යාව සංවර්ධිත රටවලට සාපේක්ෂව වේගවත්ව සිදු වී තිබීම.
- 2050 වන විට බිලියන 10 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.




3.3 ප්‍රස්තාරය - ජනසංඛ්‍යාව බිලියනයෙන් බිලියනය වර්ධනය වීමට ගත වී ඇති කාලය

මූලාශ්‍රය : *http://www.usfunds.com/media/images2*



බිලියන
10
8
6
4
3
2
1
0
1750
1800
1850
1900
1950
2000
2050
බිලියන
10
8
6
4
3
2
1
0
සංවර්ධනය වෙමින් පවතින රටවල්
සංවර්ධිත රටවල්

# ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තිය

- පෘථිවිය මතුපිට මිනිසා භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇති ආකාරයයි.
- ජන ඝනත්වය යනු, කිසියම් බිම් ඒකකයක් තුළ ජීවත් වන ජන සංඛ්‍යාවයි.

$$\text{ජන ඝනත්වය} = \frac{\text{ජන සංඛ්‍යාව}}{\text{බිම් ප්‍රමාණය}}$$

# ලෝකයේ ජනාධික කලාප

- නැගෙනහිර ආසියාව
- දකුණු හා අග්නිදිග ආසියාව
- වයඹදිග යුරෝපය
- ඇමරිකාවේ ඊසානදිග වෙරළබඩ කලාපය

❖ මෙම ජන සංකේන්ද්‍රණ කලාපවලට ලෝක භූමි ප්‍රමාණයෙන් අයත් වන්නේ 10%ක් පමණ ඉතා අඩු ප්‍රමාණයක් වුවත් ලෝක ජන සංඛ්‍යාවෙන් 64%ක් ම එම ප්‍රදේශ තුළ ජීවත් වීම විශේෂ ලක්ෂණයකි.

# 1970-1990




Data source: World Urbanization Prospects: The 2018 Revision

The designations employed and the presentation of material on this map do not imply the expression of any opinion whatsoever on the part of the Secretariat of the United Nations concerning the legal status of any country, territory, city or area or of its authorities, or concerning the delimitation of its frontiers or boundaries. Dotted line represents approximately the Line of Control in Jammu and Kashmir agreed upon by India and Pakistan. The final status of Jammu and Kashmir has not yet been agreed upon by the parties. Final boundary between the Republic of Sudan the Republic of South Sudan has not yet been determined. A dispute exists between the Governments of Argentina and the United Kingdom of Great Britain and Northern Ireland concerning sovereignty over the Falkland Islands (Malvinas).

© 2018 United Nations, DESA, Population Division. Licensed under Creative Commons license CC BY 3.0 IGO.

# ලෝකයේ ජනාධික කලාපවල විශේෂ ලක්ෂණ

- මෙම ජන සංකේන්ද්‍රණ සියල්ලම වෙරළබඩ ප්‍රදේශ ආශ්‍රිතව පිහිටා තිබීම
- මිනිස් වාසයට හිතකර භෞතික පරිසරයක් තිබීම
- ගමනාගමන පහසුව, වෙළෙඳාම හා වෙනත් ආර්ථික ක්‍රියාවන්ට යෝග්‍ය වීම
- ලෝකයේ මිලියන නගරවලින් වැඩි ප්‍රමාණයක් මෙම කලාපය තුළ පිහිටා තිබීම


Surface Pro
Jetstar
サロンパス
TSUTAYA
VISA


Infrastructure



# ලෝකයේ මිලියන නගර කිහිපයක්

- ඉන්දියාව - චෙන්නායි, බැංගලෝර්, දිල්ලිය
- තායිලන්තය - බැංකොක්
- චීනය - බීජිං, චෙන්ගු
- ආර්ජන්ටිනාව - බුවනර්ස් අයර්ස්
- ඊජිප්තුව - කයිරෝ
- බංගලාදේශය - ඩකා
- ඇමරිකා එක්සත් ජනපදය - ලොස්ඇන්ජලීස්, චිකාගෝ, නිව්යෝර්ක්
- ජපානය - ටෝකියෝ
- එක්සත් රාජධානිය - ලන්ඩන්, බර්මින්හැම්

# ලෝකයේ ද්විතියික ජන සංකේන්ද්‍රණ කලාප

- උතුරු ඇමරිකාවේ නැගෙනහිර, බටහිර හා ඊසාන දිග වෙරළබඩ කලාපය (නිව්යෝර්ක්, බොස්ටන් හා සැන්ප්‍රැන්සිස්කෝ නගර ආශ්‍රිතව)
- දකුණු ඇමරිකාවේ නැගෙනහිර වෙරළබඩ කලාපය (බ්‍රසීලයේ රියෝ ද ජැනයිරෝ නගරය ආශ්‍රිතව)
- නයිල් ගංගා මෝය ආශ්‍රිත කලාපය (ඊජිප්තුවේ කයිරෝ නගරය ආශ්‍රිතව)
- බටහිර අප්‍රිකාවේ සියේරා ලියෝන්, ලයිබීරියාව, අයිවරි කෝස්ට්, ඝානාව යන රටවල් ආශ්‍රිත කලාපය

# ලෝකයේ ජන හීන ප්‍රදේශ

- ශීත කාන්තාර ප්‍රදේශ (ආක්ටික් හා ඇන්ටාක්ටික් ප්‍රදේශ)
- උෂ්ණ කාන්තාර ප්‍රදේශ (අප්‍රිකා මහාද්වීපයේ සහරා, මධ්‍යම ඕස්ට්‍රේලියාව)
- කඳුකර ප්‍රදේශ (හිමාලය, අන්දීස්, රොකී වැනි)
- නිවර්තන වර්ෂා වනාන්තර ප්‍රදේශ (ඇමර්සන්, කොංගෝ වැනි)

❖ ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් 65%ක් පමණම ජන හීන ප්‍රදේශ වන අතර මෙම ප්‍රදේශවල ජන ඝනත්වය වර්ග කිලෝ මීටරයකට පහකටත් වඩා අඩු වේ.

❖ රළු භූ විෂමතාව හා දේශගුණය වැනි භෞතික සාධක මත මෙම ප්‍රදේශවල ජනසංඛ්‍යාව අඩු වී තිබේ.






Arctic Tundra
Arctic Tundra
Boreal Forests
Pacific Northwest
Rocky Mountains
North American
Deserts
Llanos
Amazonia
Chaco
Pantanal
Bañados del Este
Patagonia
Magellanic
Forests
Sahara
Central Asian
Deserts
Arabian
Deserts
Sundarbans
Congo
Forest
Miombo-Mopane
Kalahari
-Namib
New Guinea
Australian
Savannas
Australian Deserts
Antarctica





# ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපාන සාධක

- භෞතික සාධක
- මානුෂ සාධක
- ඓතිහාසික සාධක

# භෞතික සාධක

- දේශගුණය
    - නිවර්තන සහ සෞම්‍ය දේශගුණයක් සහිත ප්‍රදේශවල ජනගහනය අධික වන අතර අධික ශීත දේශගුණයක් සහිත ධ්‍රැවාසන්න ප්‍රදේශ ජන හීන ප්‍රදේශ වේ.
- භූවිෂමතාව
    - පෘථිවියේ රළු විෂමතාව සහිත ඉතා උස් කඳු පද්ධති සහිත ප්‍රදේශ ජන හීන වේ. තැනිතලා ප්‍රදේශ ජනාධික වේ.
    - උදාහරණ ලෙස හිමාලය, රොකී ආදී කඳු පද්ධති ප්‍රදේශ ජනහීන වේ.ෙ
- ජලවහනය
    - සරු පසක් සහිත ගංගා නිම්න ප්‍රදේශ ජනාධික වන අතර ජලය නොමැති කාන්තාර ප්‍රදේශ ජන හීන වේ.
- ඛනිජ සම්පත් ව්‍යාප්තිය
    - ඛනිජ සම්පත් ව්‍යාප්තව ඇති ප්‍රදේශ කර්මාන්ත පිහිටා ඇති බැවින් ජනාධික ප්‍රදේශ වේ.
- ස්වාභාවික වෘක්ෂලතා
    - ඇමර්සන්, කොංගෝ වැනි වැසි වනාන්තර ප්‍රදේශ ජන හීන ප්‍රදේශ වේ.

# මානුෂ සාධක

- කෘෂිකර්ම ව්‍යාප්තිය
- විවිධ කර්මාන්ත ස්ථානගත වීම
- නාගරීකරණය
- වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටා තිබීම
- වරාය පහසුකම් පැවතීම
- යටිතල පහසුකම් වර්ධනය
- විවිධ සේවාවන් ඒකරාශී වීම
- පරිපාලන කටයුතු ස්ථානගත වීම
    - ඉහත කරුණු නිසා ජනාධික ප්‍රදේශ බිහි වේ.

# ඓතිහාසික සාධක

- මානව ශිෂ්ටාචාර බිහිවීම
    - පැරණි මානව ශිෂ්ටාචාර සහිත ප්‍රදේශ වන ඉන්දු ගංගා නිම්නය, හොවැංහෝ ගංගා නිම්නය, නයිල් ගංගා නිම්නය, දෙගම්මැදි රාජ්‍ය වැනි ප්‍රදේශ ආශ්‍රිතව අදටත් ජනගහනය අධික වේ.
- යටත් විජිත බලපෑම
    - යටත්විජිත බලපෑමට හසුවූ ඉන්දියාව ඇතුළු දකුණු ආසියාතික රටවල ජනගහණය අධික වේ.

# ක්‍රියාකාරකම

1. ජන සංඛ්‍යා වර්ධන අවධි දෙකෙහි වෙනස් කම් ඇති වීමට හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.
2. ජන සංඛ්‍යා ස්පෝටනය යනු කුමක් ද?
3. සංවර්ධනය වෙමින් පවතින රටවල හා සංවර්ධිත රටවල ජන සංඛ්‍යා වර්ධන වේගය පිළිබඳ ඔබේ අදහස් කෙටියෙන් විස්තර කරන්න. (මේ සඳහා පෙළ පොත පිටු අංක 54 - 3.4 ප්‍රස්තාරය යොදා ගන්න.)
4. ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රන හතර සහ එම ප්‍රදේශවල පිහිටි මිලියන නගර ලෝක සිතියමක ලකුණු කරන්න.
5. ලෝකයේ අධික ජන සංකේන්ද්‍රණ ප්‍රදේශ වල මතු විය හැකි ගැටලු කෙටියෙන් පැහැදිලි කරන්න.